අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

teachmore.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/16/02/08/01/2026 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2026.09. 23

**චක්‍රලේඛ අංකය : 29/2024 (II)**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපතිවරුන්
සියලු ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්
සියලු ම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්
සියලු ම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්

**සුරක්ෂා සිසු රක්ෂණාවරණය**

"සුරක්ෂා සිසු රක්ෂණාවරණය" යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2024.08.02 දිනැති අංක 29/2024 දරන චක්‍රලේඛයේ සහ 2025.10.16 දිනැතිව නිකුත් කරන ලද අංක 29/2024 (I) චක්‍රලේඛ සංශෝධනයෙහි සඳහන් පහත වගන්ති සංශෝධනය වන අතර එහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

02. 2024.08.02 දිනැතිව නිකුත් කරන ලද අංක 29/2024 දරන චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් මාලාවේ, 2 වන පරිච්ඡේදයේ 2.1 සෞඛ්‍ය රක්ෂණාවරණ ප්‍රතිලාභ පහත පරිදි සංශෝධනය වේ.

i. උපදෙස් මාලාවේ 2.1.1 හි 2.1.1.3 වගන්තියෙහි " d " කරුණ ඉවත්වන අතර "e, f, g" කරුණු පිළිවෙලින් " d, e, f " ලෙස සංශෝධනය වේ.

ii. උපදෙස් මාලාවේ 2.1.1 හි 2.1.1.4 වගන්තියට 2025.10.16 දිනැතිව නිකුත් කරන ලද අංක 29/2024 (I) චක්‍රලේඛ සංශෝධනය මඟින් එකතු කරනු ලැබූ " c " කරුණ නොවෙනස්ව පවතින අතර " b " කරුණ පහත පරිදි සංශෝධනය කෙරේ. එසේම " d " ලෙස නව කරුණක් එක් කෙරේ.

b - කොඳුඇට පෙළ විකෘතිවීම නිවැරදි කිරීම සඳහා පළඳින උපාංගය (Scoliosis Brace) සඳහා වන වියදම (විශේෂඥ වෛද්‍යවරයකු - DAMS / ආයුර්වේද වෛද්‍යවරයකු - BAMS විසින් නිර්දේශිත)

d - කර්ණ ශංඛ උපකරණ (Hearing Accessories) අලුත්වැඩියා කිරීම සහ ඒ සඳහා වැය වන සේවා ගාස්තුව - විදුලි කෝෂ (Battery replacement) මාරු කිරීම හැර

iii. උපදෙස් මාලාවේ 2.1.2 වගන්තියට 2025.10.16 දිනැතිව නිකුත් කරන ලද අංක 29/2024 (I) චක්‍රලේඛ සංශෝධනය මඟින් එකතු කරනු ලැබූ " g " කරුණෙහි සඳහන් (vi) රෝගය පහත පරිදි සංශෝධනය වන අතර (viii) සහ (ix) ලෙස නව රෝග 02 ක් සහ " h " ලෙස නව කරුණක් එක් කෙරේ.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

teachmore.lk

vi - Crohn disease / Inflammatory Bowel Disease
viii - chronic kidney disease
ix - chronic inflammatory arthritis

h - පහත පරීක්ෂණ සඳහා දරනු ලබන වියදම
1. Malignancy screening test for skin cancer and post-transplant lymphoproliferative disorder (PTLD)
2. Screening test for osteoporosis
3. Screening test for hepatitis B, Hepatitis C, HIV

iv. උපදෙස් මාලාවේ 2.1.3 හි 2.1.3.1 වගන්තියේ " b " පහත පරිදි සංශෝධනය කරන අතර " q සහ r " ලෙස නව කරුණු එක් කෙරේ.

b - Cancer treatment & related testing

q - හදිසි අනතුරක් හේතුවෙන් සිදු කළ යුතු වන උකුල්, උරහිස් සහ දණහිස් සන්ධි ප්‍රතිස්ථාපනය සඳහා සිදු කරනු ලබන ප්‍රධාන ශල්‍යකර්ම (Major surgeries involving the hip, shoulder and knee arising from an accident are covered - subject to the surgeries being performed under general anesthesia)

r - PET Scan සඳහා දරනු ලැබූ වියදම

03. 2024.08.02 දිනැතිව නිකුත් කරන ලද අංක 29/2024 දරන චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් මාලාවේ, 2 වන පරිච්ඡේදයේ 2.2 හදිසි අනතුරු ප්‍රතිලාභ පහත පරිදි සංශෝධනය වේ.

i උපදෙස් මාලාවේ 2.2 වගන්තිය පහත පරිදි සංශෝධනය වන අතර 2.2.1.4 ලෙස නව කරුණක් එක් කෙරේ.

2.2. හදිසි අනතුරු ප්‍රතිලාභ (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි) යන්න හදිසි අනතුරු ප්‍රතිලාභ (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි - වාර්ෂිකව ලබා ගත හැකි උපරිම ප්‍රතිලාභ මුදල රු. 200,000.00) ලෙස සංශෝධනය කෙරේ.

2.2.1.4 පාසල තුළ දී හෝ ඉන් පිටත දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මඟින් සංවිධානය කරනු ලබන හා අධ්‍යාපන බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් (උදා - අධ්‍යාපන චාරිකා, ක්‍රීඩා උත්සව...) / සිදුවීම් / හදිසි අනතුරු අවස්ථා වල දී රු.100.000/= ක ප්‍රතිලාභ මුදලකට සිසු ජීවිත සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන යටතේ රක්ෂණය කරනු ලැබේ.

සුරක්ෂා සිසු රක්ෂණාවරණය වැඩසටහන 2026.09.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ දී ඉහත සංශෝධන අනුව කටයුතු කළ යුතු බව දන්වමි.

නාලක කලුවැව
ලේකම්